**ඇඹිලිපිටිය නගර සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 13 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණු සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ගෙවිය යුතු වියදම් රු. 12,488,419 ක් වුවත්, රු. 13,810,213 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ණයහිමියෝ රු. 1,321,794 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලේ ශේෂය රු. 16,677,054 ක් වුවත් එය රු. 16,446,902 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු. 230,152 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ සහ පළාත් සභා ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු. 8,659,468 ක් ණයගැති හා ණයහිමි ගිණුම් අතර පමණක් ගැලපීම් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා මූලධන ලැබීම් සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 1,621,936 ක වෙනසක් විය.

#### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 2,320,011 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම්**

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (අ) මුදල් රෙගුලාසි 371(2) | 937,291 | 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල අවස්ථා 13 කදී ලබාදී තිබුණු අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 570 හා 571 | 1,507,131 | 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල මිශ්‍ර තැන්පත්, ටෙන්ඩර් ඇප, සියයට 10 රඳවුම්, ආපසු ගෙවිය යුතු ගිවිසුම් ඇප හා කර්මාන්ත ගිවිසුම් ඇප සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 36,526,973 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 34,044,356 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

-----------------------

**3.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,206,000 | 18,329,258 | 16,053,437 | 37,300,469 | 18,010,200 | 17,750,100 | 19,796,209 | 29,726,104 |
| කුලී | 14,199,900 | 14,467,062 | 12,977,626 | 10,749,251 | 11,568,900 | 14,438,308 | 11,481,415 | 9,004,935 |
| බලපත්‍ර ගාස්තු | 1,777,800 | 2,303,439 | 2,052,639 | - | 2,328,800 | 3,381,968 | 2,437,101 | - |
| වෙනත් ආදායම් | 6,388,200 | 19,160,471 | 14,510,896 | 14,064,980 | 8,146,950 | 15,126,156 | 7,036,628 | 15,556,166 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 15 හා සියයට 239 කින් වැඩි වී තිබූ අතර වරිපනම් හා බදු, බදුකුලී ආදායම, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 12, සියයට 09, සියයට 06, සියයට 08 හා සියයට 27 කින් අඩුවී තිබුණි.

### 2.3.3 වරිපනම්

2017 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු වරිපනම් ශේෂය රු. 37,300,469 ක් වූ අතර, හිඟ වරිපනම් අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

### 2.3.4 කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පල්ලෙගම පොදු වෙළඳපල තුල පිහිටි කඩකාමර 27 කින් 2012 මාර්තු සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව හිඟහිට තිබූ එකතුව රු. 415,900 ක බදු කුලී 2018 මැයි වනවිටද අයකර ගෙන නොතිබුණි.

(ආ) පල්ලෙගම බස් නැවතුම්පල තුල පිහිටි තාවකාලික කඩකාමර 40 න් 15 ක් සඳහා ගිවිසුම්ගතවී නොතිබුණු අතර, කඩකාමර 32 ක් වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 3,582,741 ක හිඟ කුලී අයවිය යුතුව පැවතුණි.

(ඇ) දීර්ඝ කාලයක සිට අයවීම් හිඟහිට තිබුණු එකතුව රු. 10,579,416 ක කුලී ආදායම් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදීද අපොහොසත් වී තිබුණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

**---------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනාගැනීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කලයුතු ව්‍යාපාරික ස්ථාන 11 ක් බලපත්‍ර අළුත් නොකිරීම හේතුවෙන් සභාවට රු. 48,400 ක ආදායමක් අහිමි වී තිබූ අතර, එම ව්‍යාපාර පවත්වාගෙන යාමේදී සිදුවිය හැකි පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් සිදු නොවීම හේතුවෙන් සහා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීම ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි.

**2.3.6. වෙනත් ආදායම්**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2018 ජනවාරි වනවිට ත්‍රීරෝද රථ නැවතුම්පලවල් 29 ක් සභාව විසින් හඳුනාගෙන තිබූ අතර, එම ස්ථාන වල නවතා ඇති හඳුනාගත් ත්‍රීරෝද රථ 135 ක් 2017 වර්ෂයේදී ලියාපදිංචි නොකිරීම හේතුවෙන් සභාවට රු. 67,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) බස් රථ ගාලට ඇතුල් කරන බස් රථ වලින් ගාස්තු අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල හඳුනා ගෙන තිබූ ස්ථිර දැන්වීම් පුවරු 15 ක් සඳහා අයකල යුතු රු. 68,578 ක් වූ ගාස්තු අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 ජූලි සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු එකතුව රු. 1,761,690 ක් වූ උසාවි දඩ අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු. 12,303,290 ක මුද්දර බදු අයවිය යුතුව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 තිරසර සංවර්ධන ඉලක්ක**

**-----------------------------**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

2014 ඔක්තෝබර් 03 දින වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 127,206 ක හිඟ ණය ශේෂය සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කරගෙන නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 පෙබරවාරි 21 දිනැති මහ සභා තීරණය අනුව හිඟ වරිපනම් එකතු කිරීමට පත් කරන ලද දේපල තහනම් කිරීමේ නිලධාරියාට අධි ගාස්තුවෙන් සියයට 15 ක කොමිස් මුදලක් ගෙවිය හැකි වුවද, හිඟ වරිපනම් වටිනාකම නිවැරදිව ලැයිස්තුගත කර නොතිබුණි. ඒ හේතුවෙන් කොමිස් මුදල් ගෙවීමේ පදනම නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වීම නිසා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු. 237,012 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, 2017 දෙසැම්බර් වනවිට ඉන් රු. 41,546 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ලැබී තිබූ කර්මාන්ත ආධාර එකතුව රු. 1,005,930 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පොදු තැන්පත් ගිණුමේ නිෂ්කාර්යයව පැවතුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් අනගාරික ධර්මපාල ළමා උද්‍යානය යාවත්කාලීනව නඩත්තු කර නොමැති බව හා උද්‍යානය සඳහා ජල පහසුකම් හා වැසිකිළි පහසුකම් සපයා නොතිබීම ප්‍රධාන අඩුපාඩුවක් බව 2016 හා 2017 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් අනාවරණය කර තිබුණද, අදාල පහසුකම් සපයා උද්‍යානය වැඩිදියුණු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහජන පුස්තකාලයේ සිවිලිම අබලන් තත්ත්වයේ පවතින බව හා එහි ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් නිර්දේශ කර තිබූ නමුත් එම නිර්දේශ 2018 ජනවාරි වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

### (අ) දර්ශනගම කුමාර මහතාගේ නිවස පාර තාර දමා සංවර්ධනය කිරීම

(i) ඇස්තමේන්තුගත වියදම රු. 1,953,901 ක් වූ යථෝක්ත කර්මාන්තයේ මුල් ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 02 යටතේ ඉටුකල යුතු ප්‍රමාණය වර්ග මීටර් 17,823.5 ක් වුවද, තථ්‍ය ප්‍රමාණය වර්ග මීටර් 1,965 ක් වූයෙන් වර්ග මීටර් 15,858.5 ක් වෙනුවෙන් රු. 515,401 ක් අධි ඇස්තමේන්තු කර තිබීම නිසා සකස් කර තිබූ ඇස්තමේන්තුව අතාත්වික විය.

(ii) අදාල මාර්ගය මීටර් 414.5 ක් දුරට තාර දමා සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු පිළියෙල කර අනුමත කර තිබුණද, වැඩ විෂයය අංක 02 යටතේ සිදුව තිබූ අධි ඇස්තමේන්තු කිරීම් අනාවරණය වීමෙන් පසු එම මුදල් යොදවා අදාල මාර්ගය මීටර් 519 ක් දුරට තාර දමා සංවර්ධනය කර තිබුණි. එහෙත් ඒ සඳහා වන සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි.

### (ආ) ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය අසල පාර තාර දමා සංවර්ධනය කිරීම

ඇස්තමේන්තුගත පිරිවැය රු. 531,472 ක් වූ ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය අසල පාර තාර දමා සංවර්ධනය කිරීමේ කර්මාන්තය 2017 මැයි 15 දින වැඩ අවසන් කර තිබූ අතර, එම මාර්ගය 2017 දෙසැම්බර් 21 දින පරීක්ෂා කර මනා තත්ත්වයෙන් යුක්ත බවට හා ඒ සඳහා රැඳවුම් හා ගිවිසුම් ඇප ගෙවීම් යෝග්‍ය බවට කාර්මික නිලධාරී විසින් සහතිකර කර තිබුණි. එහෙත් 2018 ජනවාරි 11 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී මාර්ගය මතුපිට සම්පූර්ණයෙන්ම පළුදු වී තිබූ අතර, ස්ථාන කිහිපයක් ඉරි තලා පුපුරා ගොස් තිබුණි. මාර්ගයේ දෙවන වර තාර යෙදීම නිසි පරිදි සිදුකර නොතිබීම එම තත්ත්වයට හේතු වී තිබූ අතර, එය මාර්ගයේ පැවැත්ම කෙරෙහි සෘජු ලෙසම බලපාන බැවින් මෙම මාර්ගය සංවර්ධනය සඳහා ගෙවීම් කර ඇති රු. 512,376 ක වියදම නිෂ්ඵල වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු රු. 53,189,500 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඇතිකල ප්‍රතිපාදනය රු. 1,000 ක් වුවද, වියදම රු. 101,908 ක් වූයෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. 100,908 ක් වැය කර තිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් අඩුවෙන් සටහන් කිරීම |
| | | (iii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| | | (iv) | වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් කළමනාකරණය | | යාවත්කාලීනව නඩත්තු නොකිරීම |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ඉටු නොකල කාර්යයන් සඳහා ගෙවීම් කිරීම |
| (ඉ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන ඉතිරිවීම |
| | | (ii) | ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබීම |